# මනෝවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව

දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## අයදුම්කරුවන් සඳහා මූලික තොරතුරු සහ පොදු උපදෙස්

(01) මේ සමග අමුණා ඇති අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට 2023 මාර්තු 15 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ පාඨමාලා සමායෝජක, මනෝවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව, දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් බාරදිය යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්‍ර කිසිදු හේතුවක් මත හෝ සලකා බලනු නොලැබේ. ලියුම් කවරයේ ඉහළ භාෂා මාධ්‍ය පැහැදිළිව දැක්විය යුතුය.

(02) පාඨමාලා ගාස්තු සහ අනෙකුත් ගාස්තු

පාඨමාලා ගාස්තුව - රු 60000.00 (මෙම ගාස්තුව වාරික තුනකින් ගෙවිය හැකිය.)

අයදුම්පත් ගාස්තුව - රු 500.00 (මෙම ගාස්තුව ඕනෑම මහජන බැංකු ශාඛාවකින් 013010001777 දරන ගිණුමට ගෙවා එම රිසිට්පත අයදුම්පත සමග අනිවාර්යයෙන් එවිය යුතුය.)

විභාග ගාස්තු - රු 1500.00

(03) මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට අ.පො.ස. සා.පෙළ හා උසස්පෙළ සමත් විය යුතුය. එසේ නොමැති අපේක්ෂකයන් SLQF 3 මට්ටමේ ඩිප්ලෝමා සඳහා නියමිත අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් ඒ අයට ද ඉල්ලුම් කළ හැකිය.

(04) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා තිබිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේදී අදාළ ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකයේ පිටපත
2. ජාතික හැඳුනුම්පතේ පිටපත
3. අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සහතික පිටපත්

(05) සම්මුඛ පරීක්ෂණයෙන් පසු ඔබව පාඨමාලාවට තෝරාගනු ලැබුව හොත් ඒ බව ඔබට ලිඛිතව දැනුම් දෙන අතර පාඨමාලා ගාස්තු ඉන් අනතුරුව ගෙවිය යුතුය.

(06) පාඨමාලාව ඉරිදා දිනවලදී පෙ.ව. 8.30 සිට පැවැත්වෙන අතර මාර්ගගතව හා විශ්වවිද්‍යාලය තුළදී දේශන පැවැත්වේ. ඒ පිළිබඳ සියලු තීරණ පාඨමාලා සමායෝජක විසින් ක්‍රියාත්මක කරන අතර අපේක්ෂකයන් එම තීරණවලට එකඟ වියයුතුය.

(07) පාඨමාලාව වසරක කාලයක් පැවැත්වෙන අතර සමාසික දෙකක් ලෙස එය කොටස් කරනු ලැබේ.

| පළමු සමාසිකය | දෙවන සමාසිකය |
|---|---|
| DPSY 1110 සාමාන්‍ය මනෝවිද්‍යාව | DPSY 1210 උපදේශන මනෝවිද්‍යාව හැඳින්වීම |
| DPSY 1120 ළමා මනෝවිද්‍යාව | DPSY 1220 සමාජ මනෝවිද්‍යාව |
| DPSY 1130 අසාමාන්‍ය මනෝවිද්‍යාව | DPSY 1230 කාර්මික මනෝවිද්‍යාව |
| DPSY 1140 පෞරුෂ මනෝවිද්‍යාව | DPSY 1240 ප්‍රජනන මනෝවිද්‍යාව |
| DPSY 1150 අධ්‍යාපන මනෝවිද්‍යාව | DPSY 1250 මනෝවිද්‍යා පර්යේෂණ ක්‍රමවේදය හා පර්යේෂණ වාර්තාව |

(08) සියලු දේශන පවත්වනු ලබන්නේ විශ්වවිද්‍යාලයීය ආචාර්ය මණ්ඩලය හා බාහිර සම්පත්දායකයන් විසිනි.

(09) පාඨමාලාව උදෙසා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා යන වියදම් හෝ ගාස්තු පාඨමාලා ගාස්තුවට ඇතුළත් නොවේ.

(10) පාඨමාලාවට සම්බන්ධ වන සියලු දෙනා විශ්වවිද්‍යාලයීය විභාග නීති සහ අනෙකුත් නීති පිළිගත යුතු අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය ඩිප්ලෝමා අපේක්ෂකයෙකු ලෙස විශ්වවිද්‍යාලයේ කීර්තිනාමය රැකෙන අයුරින් කටයුතු කළ යුතුය.

පාඨමාලා සමායෝජක
මනෝවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව
දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2023/02/20

නියෝජ්‍ය ලේඛකාධිකාරී
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය